# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 සැප්තැම්බර් මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

(2019.09.18 දින නිකුත් කරන ලදී)

## ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

එල්.ඩී.—ඕ. 26/2018

### 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2019 අංක      දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1980 අංක 44 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තියේ, “ජුනි මස පළමුවන දිනය,” යන වචන වෙනුවට, “පෙබරවාරි මස පළමුවන දිනය” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එහි (1) වන උපවගන්තියේ, “ජුනි මස පළමුවන දිනය,” යන වචන වෙනුවට, “පෙබරවාරි මස පළමුවන දිනය” යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (2) වන උපවගන්තියේ, “ජුනි මස පළමුවන දිනයේ දී” යන වචන වෙනුවට, “පෙබරවාරි මස පළමුවන දිනයේ දී” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එහි (3) වන උපවගන්තියේ, “ජුනි මස පළමුවන දිනයේ දී,” යන වචන වෙනුවට, “පෙබරවාරි මස පළමුවන දිනයේ දී” යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ, “ජුනි මාසයේ පළමුවන දිනයෙහි,” යන වචන වෙනුවට, “පෙබරවාරි මාසයේ පළමුවන දිනයෙහි” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

“සුදුසුකම් ලැබීමේ විවිධ දින හා පරිපූරක ලැයිස්තු.

20අ. (1) 3 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද-

(අ) යම් වර්ෂයක පෙබරවාරි මස පළමුවන දිනෙන් ආරම්භ වී එම වර්ෂයේ ම මැයි මස තිස්එක්වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;

(ආ) යම් වර්ෂයක ජුනි මස පළමුවන දිනෙන් ආරම්භ වී එම වර්ෂයේ ම සැප්තැම්බර් මස තිස්වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත; සහ

(ඇ) යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමුවන දිනෙන් ආරම්භ වී පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස්එක්වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත,

අටළොස් විය සම්පූර්ණ කරන යම් තැනැත්තකු, ඡන්ද හිමියකු ලෙස නාමලේඛනයක තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට හෝ සුදුසුකම් ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම්ලත් සෑම තැනැත්තකු විසින් ම ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඔහු පදිංචිව සිටින මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තකු විසින්ම—

(අ) එම තැනැත්තා අටළොස් විය සම්පූර්ණ කර සති දෙකක කාලසීමාවක් ඇතුළත; සහ

(ආ) එම තැනැත්තාගේ උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ,

තමා පදිංචිව සිටින මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කළ යුතු ය.

(4) මැතිවරණ කොට්ඨාසයක සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් ම —

(අ) යම් වර්ෂයක පෙබරවාරි මස පළමුවන දින සහ එම වර්ෂයේ ම මැයි මස තිස්එක්වන දින අතර කාලයේ දී අටළොස් විය සම්පූර්ණ කර ඇති ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති සියලු තැනැත්තන් ;

(ආ) යම් වර්ෂයක ජූනි මස පළමුවන දින සහ එම වර්ෂයේ ම සැප්තැම්බර් මස තිස්වන දින අතර කාලයේ දී අටළොස් විය සම්පූර්ණ කර ඇති ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති සියලු තැනැත්තන් ; සහ

(ඇ) යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමුවන දින සහ පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස්එක්වන දින අතර කාලයේ දී අටළොස් විය සම්පූර්ණ කර ඇති ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති සියලු තැනැත්තන්,

සම්බන්ධයෙන් පිළිවෙළින් පරිපූරක ලැයිස්තු සකස් කළ යුතු ය.

(5) එක් එක් මැතිවරණ කොට්ඨාසවල සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් ම, සති දෙකක කාලසීමාවක් ඇතුළත, (4) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන අදාළ පරිපූරක ලැයිස්තු සම්පූර්ණ කර ඇති බව හා එකී පරිපූරක ලැයිස්තු හෝ ඒවායෙහි පිටපත් ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කාර්යාලයේ දී හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි මැතිවරණ කොට්ඨාසය තුළ එවැනි වෙනත් ස්ථානයක දී දවසේ සියලු යුක්ති සහගත වේලාවන් තුළ පරීක්ෂා කිරීමට හැකි බව දන්වමින් දැන්වීමක් කරනු ලැබිය යුතු ය. එකී සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම දැන්වීම් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන එක් එක් භාෂාවලින් පළවන යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ පළ කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ සකස් කරන ලද පරිපූරක ලැයිස්තුවක තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට අයිතිය කියා සිටින සෑම තැනැත්තකු ම, එම ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත් කරවා ගැනීම සඳහා මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය. එවැනි සෑම ඉල්ලීමක් ම පරිපූරක ලැයිස්තුවට අදාළ දැන්වීම පළ කරනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ සකස් කරන ලද පරිපූරක ලැයිස්තුවක යම් තැනැත්තකුගේ නම ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ලියාපදිංචි ඡන්ද හිමියකු විසින්, විරෝධය පෑම කරනු ලැබිය හැකි අතර, එකී සෑම විරෝධය පෑමක් ම එම පරිපූරක ලැයිස්තුවට අදාළ දැන්වීම පළ කරනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

(8) 14 වන වගන්තියේ (6) වන උපවගන්තිය සිට (16) වන උපවගන්තිය දක්වා ඇති උපවගන්තිවල හා 15 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, මේ පනත යටතේ කරනු ලබන හිමිකම්පෑම් හා විරෝධයපෑම් සම්බන්ධයෙන් වන තීරණයට අදාළ විය යුතු ය.

(9) හිමිකම්පෑම් හා විරෝධයපෑම් නිශ්චය කරනු ලැබීමෙන් ඉක්බිතිව ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් මේ වගන්තිය යටතේ ඔහු විසින් සකස් කරන ලද පරිපූරක ලැයිස්තු සහතික කළ යුතු ය. එසේ සහතික කිරීමෙන් පසු, පරිපූරක ලැයිස්තු එම මැතිවරණ කොට්ඨාසය සඳහා වූ මැතිවරණ නාමලේඛනයට ඇතුළත් කළ යුතු ය.

(10) යම් මැතිවරණයක් පිළිබඳ ප්‍රකාශනය කරනු ලැබූ දිනට අටළොස් විය සම්පූර්ණ කර ඇති තැනැත්තන්ගේ පරිපූරක ලැයිස්තු, *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු අතර, එකී පරිපූරක ලැයිස්තු ඇතුළත් කරන ලද ඡන්දහිමි නාමලේඛනය, එම මැතිවරණයේ ඡන්ද හිමි නාමලේඛනය ලෙස සලකනු ලැබිය යුතු ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.